වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
**Department of Trade and Investment Policy**

මහලේකම් කාර්යාලය, කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo -01

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
Ministry of Finance and Mass Media

මගේ අංකය / எனது இல. / My No. : TIP/SS/01/04/04/XX
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2018.07.03

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 සහ 01/2018 (1) හි සඳහන් විධිවිධාන ක්‍රියාවට නැංවීමේදී පැන නැගී ඇති ගැටළු සම්බන්ධයෙන් පහත පැහැදිලිකිරීම් පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.

I. දෙවන වරට හෝ ඊට වැඩි වාරයකදී බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරියෙකු හට අදාල බලපත්‍රය ලබා දීම සඳහා සලකා බලනු ලබන්නේ අවසන් වරට බලපත්‍රය සඳහා ණයවර ලිපිය විවෘත කල දින සිට වසර 5 ක **සක්‍රීය සේවා කාලයකි.**

II. අවසන් වරට බලපත්‍රය මත මෝටර් රථයක් ලබා ගැනීම සඳහා විවෘත කල ණයවර ලිපියේ පිළිගත හැකි පිටපතක් (බැංකු ලිපි ශීර්ෂයක බැංකුවේ නිලධාරියෙකුගේ අත්සන හා නිල මුද්‍රාව සහිත) හෝ එම ණයවර ලිපිය විවෘත කරන ලද දිනය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන පිළිගත හැකි ලේඛණයක් මගින් අදාල කරුණ පිළිබඳව සනාථ වන්නේ නම් එය චක්‍රලේඛයේ 8.2.ii වගන්තියට අදාලව ප්‍රමාණවත් ලේඛණයක් ලෙස සැලකිය හැක. ඒ සඳහා ආනයනය කරන ලද වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත, එහි ආදායම් සහතිකය, මුල් පත්වීම් ලිපි, ස්ථිර කිරීමේ ලිපි ආදිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය නොවන බවද නිරීක්ෂණය කර ඇත.

III. එසේ වුවද, බලපත්‍ර නිකුත් කිරීමට බලය ඇති නිලධාරියා විසින් සෑහීමකට පත් නොවන ඕනෑම කරුණක් සනාථ කර ගැනීම සඳහා චක්‍රලේඛයේ 8.2.iv වගන්තිය අනුව ඔහු විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන ඕනෑම සහතිකයක් හෝ වෙනත් ලියවිල්ලක් බලපත්‍රය ඉල්ලා සිටින නිලධාරියෙකු වෙතින් ලබා ගැනීමට හැකිය.

IV. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 සහ එහි සංශෝධන යටතේ බලපත්‍රයක් හිමි නිලධාරියෙකුට 4 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රය යටතේ ලබා ගත හැක්කේ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ (HS Code) 87:03 යටතේ වන ස්ටේෂන් වැගන් ඇතුළුව ප්‍රධාන වශයෙන්ම පුද්ගලයන් ප්‍රවාහනය කිරීම සඳහා සැලසුම් කරන ලද මෝටර් කාර් සහ අනෙකුත් මෝටර් වාහන හෝ 87:04 යටතට අයත් ඩබල් කැබ් රථ පමණක් වේ.

සී. ජයසූරිය
අධ්‍යක්ෂ ජනරාල්